# දැන්වීමයි

## සීමාසහිත ගලහ දෙල්තොට විවිධ සේවා සමුපකාර සමිතිය- දෙල්තොට

## සාමාන්‍යාධිකාරී - I තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

සීමාසහිත ගලහ දෙල්තොට විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති වැටුප් පරිමාණ අංක H.L 01:01 දරන සාමාන්‍යාධිකාරී - I තනතුර සඳහා මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ 06/2022 චක්‍රලේඛය අනුව සුදුසුකම් සපුරන මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කය තුළ හා දරාඹය ග්‍රාමීය බැංකු බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුර** :- සාමාන්‍යාධිකාරී - I -තනතුරු 01

**02. වැටුප් පරිමාණ අංකය** :- H.L - 01:01

**03. වැටුප් පරිමාණය** :- 36000 - 720X10 - 1080X10 - 1440X10 = 68400/-

**04. වයස් සීමාව** :- අවු: 18 - 50
(සමුපකාර සේවයේ නිරත අයවලුන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**05. සුදුසුකම් :-**

අ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී II ශ්‍රේණියේ වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක්/ සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු) වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (වානිජ) තනතුරක වසර 06ක ස්ථිර සේවා පළපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (පිරිස්) තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

ආ පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සමත් වී තිබීම. ( රාජ්‍ය පරිපාලනය/ කළමනාකරණය/ වාණිජ/ ව්‍යාපාර පරිපාලනය/ ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රයක උපාධියක් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.) / උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණය/ වාණිජ/ කළමනාකරණ ඩිප්ලෝමාව සමත් වීම.

**හෝ**

ඇ ජාතික සමුපකාර සංවර්ධන ආයතනය/ පිළිගත් ආයතනයක සමුපකාර ව්‍යාපාරයට අදාළ විෂයයන් ඇතුළත් මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමා පාඨමාලාවක් සමත් වීම/ පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් පවත්වනු ලබන සමුපකාර ව්‍යාපාරයට අදාළ මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමාවක් සමත් වීම.

**06. අයදුම්පත් ඉදිරිපත් කිරීම :-**

සමිතිය විසින් පිළියෙල කර ඇති අයදුම්පත්‍රයක් සමිති ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත යුතුය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සමග පදිංචි සහතිකය, උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, සියලුම අධ්‍යාපන හා වෘත්තීය සහතිකපත්වල සහ මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක සහතික කළ ඡායා පිටපත් යොමුකළ යුතුය. දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමුකළ යුතුය. නියමිත පරිදි සම්පූර්ණ නොකළ හෝ ලබා දී ඇති උපදෙස්වලට පටහැණිව ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සියලුම අයදුම්පත් **2025.07.21 වන දින ප.ව. 12.00ට** පෙර ගරු සභාපති, සීමාසහිත ගලහ දෙල්තොට විවිධ සේවා සමුපකාර සමිතිය, දෙල්තොට යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතු අතර අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කළ යුතුය.

**07. විමසීම් :- 081-24 67 218 (ප්‍රධාන කාර්යාලය)**

**galahadeltotampcs2429@gmail.com**